# 04 ආර්ථික ක්‍රම හා ආර්ථික සබඳතා

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් ඔබට,

- මූලික ආර්ථික ප්‍රශ්න හා ආර්ථික කටයුතු විමර්ශනය කිරීමටත්,
- විවිධ ආර්ථික ක්‍රම පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීමටත්,
- සංවර්ධනයට සාපේක්ෂ ව වර්තමාන ආර්ථික ක්‍රම විශ්ලේෂණය කිරීමටත්,
- ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම විශ්ලේෂණය කිරීමටත්,

හැකියාව ලැබෙනු ඇත.

## මූලික ආර්ථික ප්‍රශ්න හා ආර්ථික ක්‍රියාකාරකම්

සමාජ ක්‍රමයක් තුළ මිනිසුන් ජීවත්වීමේ දී විවිධ අවශ්‍යතා හා වුවමනා ඇතිවේ. මෙම වුවමනා ඉටු කර ගැනීමට යාමේ දී ඔවුනට විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට ද සිදුවේ. එසේ මුහුණ දීමට සිදුවන ප්‍රශ්න විසඳා ගැනීමේ දී එක් එක් සමාජ කටයුතු කරන ආකාරයන් ද විවිධ වේ.

මිනිසාට මුහුණ දීමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා යම් සමාජයක් සංවිධානය වී ඇති ආකාරය අර්ථ ක්‍රමයක් ලෙස හැඳින්වේ.

සමාජයක සමූහයක් ලෙස ජීවත්වීමේ දී මිනිසාට විවිධ අවශ්‍යතා හා වුවමනාවන් ඇතිවන බව ඔබ දැනටමත් දන්නවා ඇත. මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික දේවල් අවශ්‍යතා ලෙස හැඳින්වේ. ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් ආදිය අවශ්‍යතා සඳහා උදාහරණ වේ. ඒවා මූලික අවශ්‍යතා ලෙසට ද විග්‍රහ කරනු ලැබේ.

ඉහත අවශ්‍යතා විවිධ පුද්ගලයන් විසින් විවිධ ආකාරයට සපුරා ගැනීමට කටයුතු කරනු ලැබේ. අවශ්‍යතා ඉටු කර ගන්නා විවිධ ස්වරූපයන් වුවමනා ලෙස හැඳින්වේ. නිවාස මූලික අවශ්‍යතාවක් වුව ද එය ඉටු කර ගැනීමේ දී පැල්පත්, මැටි ගෙවල්, තට්ටු නිවාස ආදී විවිධ ආකාරයට ඉදි කරනු ලබයි. වුවමනා පුද්ගලයාගේ සමාජ ආර්ථික තත්ත්වය අනුව විවිධ වන බව ඉහත උදාහරණයෙන් පැහැදිලි වේ.

පුද්ගලයන්ගේ වුවමනාවන් විවිධ වන්නා සේ ම අසීමිත වන බව ද අපි දනිමු. නමුත් මෙම වුවමනා ඉටු කර ගැනීමට අවශ්‍ය තරම් සම්පත් නොමැති බව ද දනිමු. අපට විශාල ගෙයක් සාදා ගැනීමට අවශ්‍ය වුව ද තිබෙන ඉඩම, මුදල් වැනි සාධක මත එය ඉටු කර ගැනීමට යාමේ දී ප්‍රශ්න මතුවිය හැකි ය. ඒ නිසා තිබෙන සම්පත් තුළින් මෙම අසීමිත වුවමනාවන් ඉටු කර ගැනීමට නම් අපට යම් ක්‍රමානුකූල විද්‍යාත්මක ක්‍රම වේදයක් යටතේ කටයුතු කිරීමට සිදුවේ.

ක්‍රියාකාරකම

- මිනිස් අවශ්‍යතා හා ඒවාට අදාළ වුවමනා වගුවකින් දක්වන්න.

## මූලික ආර්ථික ප්‍රශ්න

මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමට යාමේ දී, විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවන බව මීට පෙර උගත්තෙමු. මෙම ප්‍රශ්න කුමන අර්ථ ක්‍රමයකට වුව ද පොදුය. මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා අසීමිත වීමත්, ඒ සඳහා තිබෙන සම්පත් සීමිත වීමත් එයට හේතුව වේ. එය අපි හිඟකම ලෙසින් හඳුන්වමු. හිඟකම නිසා වුවමනා සපුරා ගැනීමේ දී තේරීමට සිදුවේ. ඕනෑ ම අර්ථ ක්‍රමයකට මුහුණ දීමට සිදුවන ප්‍රශ්න, මූලික ආර්ථික ප්‍රශ්න ලෙසින් ද හැඳින්වේ. ඒවා ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකි ය.

4.1 රූපය

### 1. කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?

තිබෙන සම්පත් උපයෝගී කර ගෙන කුමන භාණ්ඩයක් නිෂ්පාදනය කරන්නේ ද යන්න තීරණය කිරීමට සිදුවේ. එසේම තෝරාගත් භාණ්ඩයෙන් කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නේ ද යන ගැටලුව ද මතුවේ. සම්පත්වලින් ගත හැකි විකල්ප ප්‍රයෝජන රාශියක් තිබීම මෙම ප්‍රශ්නයට මූලික හේතුව වේ.

පුද්ගලයාගේ සියලු ම අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමට නොහැකි නිසා මුලින් ම තීරණය කළ යුත්තේ කුමන වුවමනා ඉටු කරන්නේ ද යන්න ය. ඉහත චිත්‍රයෙන් ඒ සඳහා ගත හැකි විකල්ප තීරණ කිහිපයක් පෙන්නුම් කරයි. කුමක්, කොපමණ ප්‍රමාණය බැගින් නිපදවන්නේ ද යන්න තීරණය කළ හැක්කේ ආර්ථිකය සංවිධානය වී ඇති ආකාරය අනුවයි.

### 2. කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?

නිෂ්පාදනය කළ යුතු භාණ්ඩය, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද යන ප්‍රශ්නය විසඳා ගැනීමෙන් පසු ව ඊළඟට මුහුණ දීමට සිදුවන ආර්ථික ප්‍රශ්නය වන්නේ කෙසේ නිෂ්පාදනය කරන්නේ ද යන්නයි. එහිදී අතුරු ප්‍රශ්න දෙකකට මුහුණ දීමට සිදුවේ. එනම්,

i. යොදා ගන්නා ශිල්පීය ක්‍රමය කුමක් ද?

ii. නිෂ්පාදනය කරනු ලබන්නේ කුමන අංශයෙන් ද? යන්නයි.

## i. යොදා ගන්නා ශිල්පීය ක්‍රමය කුමක් ද?

නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙකකි.

- **ප්‍රාග්ධන සූක්ෂ්ම**

භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩිපුර යන්ත්‍ර සූත්‍ර හා වෙනත් ප්‍රාග්ධන භාණ්ඩ යොදා ගැනීම ප්‍රාග්ධන සූක්ෂම නම් වේ. උදා: කෘෂිකර්මය සඳහා වැඩිපුර යන්ත්‍ර භාවිත කරන්නේ නම් එය ප්‍රාග්ධන සූක්ෂම කෘෂිකර්මයකි.

- **ශ්‍රම සූක්ෂ්ම**

භාණ්ඩ නිෂ්පාදනයේ දී මිනිස් ශ්‍රමය බහුල ව යොදා ගැනීම ශ්‍රම සූක්ෂ්ම නම් වේ. උදා: කෘෂිකර්මය සඳහා කම්කරුවන් වැඩි පිරිසක් යොදා ගන්නේ නම් එය ශ්‍රම සූක්ෂම කෘෂිකර්මයකි.

## ii. නිෂ්පාදනය කරනුයේ කුමන අංශයෙන් ද?

කුමන අංශයෙන් නිෂ්පාදනය කරන්නේ ද යන්න කෙසේ නිෂ්පාදනය කරන්නේ ද යන්න යටතේ දෙවනුව වැදගත් වේ. නිෂ්පාදනය රාජ්‍ය හෝ පෞද්ගලික අංශය තුළ ද එම අංග දෙකෙහි ම ඒකාබද්ධතාවයෙන් ද සිදු කළ හැකි ය.




නූතන ලෝකයේ නිෂ්පාදන කටයුතු පහසු කිරීම සඳහා තනි පුද්ගල, සමාගම්, හවුල් ව්‍යාපාර, සමුපකාර සමිති ආදී විවිධාකාරයෙන් සංවිධානය වී ඇත.

## කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනු ලබන්නේ කවුරුන් උදෙසා ද යන්න තීරණය කිරීම මෙමගින් අදහස් වේ. මිලදී ගැනීමේ හැකියාව අනුව සමාජය විවිධ පාරිභෝගික කණ්ඩායම්වලින් සමන්විත වේ. නිෂ්පාදනය කිරීමේ දී ඔවුන්ගෙන් ඉලක්ක කර ගන්නේ කුමන කණ්ඩායම ද යන්න මෙහි දී වැදගත් වේ. එනම් නිපදවනු ලබන භාණ්ඩ හෝ සේවා පාරිභෝගිකයින් අතර බෙදා හරින්නේ කෙසේ ද යන්න මෙහි අදහසයි. උදාහරණ වශයෙන් ඉහළ ලාභයක් ලැබිය හැකි සුඛෝපභෝගී භාණ්ඩ නිෂ්පාදනය කොට ඉහළ ආදායම් ලබන පිරිස් සඳහා නිපදවන්නේ ද? නැතහොත් අඩු ආදායම් ලබන්නන් සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ නිපදවන්නේ ද? යන්න තීරණය කිරීම දැක්විය හැකි ය.

**ක්‍රියාකාරකම**

- ඔබට ප්‍රධාන මාර්ගයකට යාබද ව හිස් ඉඩමක් ඇතැයි සිතන්න. එම ඉඩම යම් ආර්ථික කටයුත්තකට යෙදවීමට අදහස් කරන්නේ නම් ඉහත ආර්ථික ප්‍රශ්න අනුව ඔබ ගන්නා තීරණ විස්තර කරන්න.

## නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම්

මිනිස් වුවමනා ඉටු කර ගැනීමේ දී විවිධ භාණ්ඩ හා සේවා යොදා ගනු ලැබේ. එම භාණ්ඩ ප්‍රධාන කොටස් දෙකකි.

- ආර්ථික භාණ්ඩ - නිෂ්පාදනයේ දී පිරිවැයක් දැරීමට සිදුවන සහ පරිහරණය සඳහා මිලක් ගෙවීමට සිදුවන භාණ්ඩ උදා: ඉහත ලක්ෂණ දැකිය හැකි ආහාර, ඇඳුම්, ඖෂධ ආදිය
- ආර්ථික නොවන භාණ්ඩ - අපට ස්වභාව ධර්මයෙන් නොමිලේ ලැබෙන භාණ්ඩ උදා: හිරු එළිය, ජලය, වාතය

ආර්ථික නොවන භාණ්ඩ හෙවත් අපට නොමිලේ ලැබෙන භාණ්ඩ ඇතැම් විට ආර්ථික භාණ්ඩ වන අවස්ථා ද දක්නට ලැබේ.

උදා:

- ජලය අපට නොමිලයේ ලැබුණ ද බෝතල් කළ ජලය ලබා ගැනීමේ දී මිලක් ගෙවීමට සිදුවීම.
- හිරු එළිය භාවිත කර නිපදවනු ලබන විදුලිය සඳහා මිලක් ගෙවීමට සිදුවීම.
- නයිට්‍රජන් වායුව ගබඩා කර වාහනවලට යෙදීමේ දී මිලක් ගෙවීමට සිදුවීම.

4.2 රූපය

## 1. භූමිය

පොළව හා ඒ සම්බන්ධ සියලු සම්පත් භූමියට අයත් වේ. මෙම භාවිතය නිෂ්පාදනය සඳහා යොදු ගැනීමේ දී කරනු ලබන ගෙවීම බදු කුලිය ලෙස හැඳින්වේ.

## 2. ශ්‍රමය

4.3 රූපය

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා විවිධ පුද්ගලයන් විසින් වැය කරන කායික හා මානසික ශක්තිය ශ්‍රමය ලෙස හැඳින්වේ. කම්කරුවන්, ගොවීන්, රියදුරන් වැනි අය සාපේක්ෂ ව වැඩිපුර කායික ශක්තිය වැය කරන හෙයින් එය කායික ශ්‍රමය ලෙස හැඳින්වේ. වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගුරුවරුන් වැනි අය සාපේක්ෂ ව වැඩිපුර මානසික ශක්තිය වැය කරන හෙයින් එය මානසික ශ්‍රමය ලෙස හැඳින්වේ. ශ්‍රමයට කරන ගෙවීම වැටුප නම් වේ.



4.4 රූපය

## 3. ප්‍රාග්ධනය

නිෂ්පාදනය සඳහා මිනිසා විසින් යොදවනු ලබන (ආයෝජනය කරන) විවිධ මෙවලම් හා උපකරණ ප්‍රාග්ධනය වේ. ප්‍රාග්ධනය ලෙස යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි ආදිය දැක්විය හැකි ය. ප්‍රාග්ධනය සඳහා කරන ගෙවීම පොළිය ලෙස හැඳින්වේ.

4.5 රූපය

## 4. ව්‍යවසායකත්වය

නිෂ්පාදන සාධක එකම ස්ථානයක ස්ථානගත වී නොමැත. ඒවා විවිධ ස්ථානවල හා පුද්ගලයන් අතර විසිරී පවතී. එසේ විසිරී ඇති නිෂ්පාදන සාධක එකතු කර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මෙහෙයවීමේ කාර්යය ව්‍යවසායකත්වය නම් වේ. මේ සඳහා කරන ගෙවීම ලාභ හෙවත් ලාභය වේ.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**ක්‍රියාකාරකම**

- මිනිස් වුවමනා සඳහා යොදා ගන්නා භාණ්ඩ පහක් නම් කරන්න. ඒ ඒ භාණ්ඩ සඳහා භාවිත කරන නිෂ්පාදන සාධක වගුවක් ලෙසින් දක්වන්න.

## ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි

ආර්ථිකයක විවිධ ක්‍රියාවලීන් සිදු වේ. එම ක්‍රියාවලීන් ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකි ය.

- නිෂ්පාදනය
- බෙදාහැරීම
- පරිභෝජනය

### 1. නිෂ්පාදනය

ආර්ථිකයක සම්පත් මිනිස් වුවමනා ඉටු කර ගත හැකි ආකාරයට වෙනස් කිරීම නිෂ්පාදනය නම් වේ. ආර්ථිකයක සිදුවන නිෂ්පාදනය මූලික වශයෙන් පහත සඳහන් පරිදි අංශ තුනකට බෙදිය හැකි ය.

- **කෘෂිකාර්මික නිෂ්පාදනය**

තේ, රබර්, පොල්, වී හා වෙනත් ධාන්‍ය වර්ග, එළවළු, පළතුරු, මස්, මාලු, බිත්තර ආදිය

4.6 රූපය

4.7 රූපය

- **කාර්මික නිෂ්පාදනය**

යන්ත්‍ර සූත්‍ර, මෝටර් රථ, ඇඟලුම්, ලිපිද්‍රව්‍ය, සකස් කළ ආහාර ආදිය

4.8 රූපය

- **සේවා නිෂ්පාදනය**

අධ්‍යාපනය, සෞඛ්‍ය, තැපැල්, විදුලි සංදේශ, විදුලිය, ප්‍රවාහනය ආදිය

නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව ද කොටස් තුනකට බෙදිය හැකි ය.

| පාරිභෝගික භාණ්ඩ | අන්තර් භාණ්ඩ | ප්‍රාග්ධන භාණ්ඩ |
|---|---|---|
| පුද්ගල අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීම සඳහා යොදා ගන්නා භාණ්ඩ හා සේවා පාරිභෝගික භාණ්ඩ ලෙස හැඳින්වේ.<br>උදා : එදිනෙදා භාවිතයට ගන්නා ආහාර ද්‍රව්‍ය, ඇඳුම් පැලඳුම්, ඖෂධ ආදිය | කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කර ගැනීම සඳහා උපයෝගී කර ගන්නා භාණ්ඩ අන්තර් භාණ්ඩ ලෙස හැඳින්වේ. අන්තර් භාණ්ඩ එක් වරක් භාවිතයෙන් අවසන් වීම විශේෂ ලක්ෂණයකි. නැවත නැවත භාවිතයට ගත නොහැක.<br>උදා: වී නිෂ්පාදනය සඳහා යොදා ගන්නා පොහොර, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිත කරන දැව | නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සෘජු ව යොදා ගන්නා භාණ්ඩ ලෙස ද හැඳින්වේ. ආයෝජන භාණ්ඩ ලෙස ද හැඳින්වේ. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදන කාර්යයේ දී නැවත නැවත යොදා ගැනීමට හැකිවේ.<br>උදා: යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, වාහන |

## 2. බෙදා හැරීම

නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා දක්වා ලබා දීමේ ක්‍රියාවලිය බෙදා හැරීම නම් වේ. අතීතයේ දී තමන්ට අවශ්‍ය භාණ්ඩ තමන් ම නිපදවා ගත් බැවින් භාණ්ඩ හුවමාරුවක් සිදු නොවී ය. ඉන් පසු ව භාණ්ඩ වෙනත් භාණ්ඩවලට හුවමාරු කර ගැනීමේ ක්‍රමයක් ඇති විය. උදහරණ ලෙස යමෙක් තම වී නිෂ්පාදනයේ අතිරික්තය වෙනත් අයෙකුට ලබා දී ඒ වෙනුවට ලුණු, කරවල, ඇඳුම් වැනි වෙනත් භාණ්ඩයන් ලබා ගැනීම දක්විය හැකි ය. වර්තමානය වන විට වෙළෙඳපොළ මගින් මුදල් මාධ්‍ය කොට ගෙන භාණ්ඩ හුවමාරු කර ගැනීමක් සිදුවේ. මෙම ක්‍රියාවලිය වෙළෙඳාම ලෙස ද හැඳින්විය හැකි ය. වෙළෙඳාම රටක් අභ්‍යන්තරයේ පමණක් නොව ජාත්‍යන්තරව ද සිදුවේ. වෙළෙඳාම ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය.

4.9 රූපය

4.10 රූපය

- **තොග වෙළඳාම**

නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ විශාල තොග වශයෙන් අවසන් පාරිභෝගිකයාට නොව, අතරමැදි වෙළෙඳුන්ට ලබා දීමේ කාර්යය තොග වෙළෙඳාම නමින් හැඳින්වේ. තොග වෙළෙඳාම, නිෂ්පාදකයා හා තොග වෙළෙන්දා අතරත්, තොග වෙළෙන්ද හා සිල්ලර වෙළෙන්දා අතරත් සිදු වේ.

- **සිල්ලර වෙළඳාම**

නිෂ්පාදකයාගෙන් හෝ තොග වෙළෙන්දාගෙන් සිල්ලර වෙළෙන්දා ලබා ගන්නා භාණ්ඩ පාරිභෝගිකයා කුඩා ප්‍රමාණයන්ගෙන් ලබා දීම සිල්ලර වෙළෙඳාමයි. නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා භාණ්ඩ ගලා යාමේ ක්‍රියාවලියේ දී හමුවන අවසාන අතරමැදියා සිල්ලර වෙළෙන්දා ය.

## 3. පාරිභෝජනය

ආර්ථිකයක නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා යොදා ගෙන මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීම පාරිභෝජනය වේ. එසේ අවශ්‍යතා ඉටු කර ගන්නා පුද්ගලයා පාරිභෝගිකයා ලෙස හැඳින්වේ. පුද්ගලයාගේ අවශ්‍යතා හා වුවමනා ඍජුව ඉටු කර ගැනීමට දායක කර ගන්නා භාණ්ඩ පාරිභෝජන භාණ්ඩ ලෙස හැඳින්වේ. ආහාර පාන, ඇඳුම් පැලඳුම්, වාහන ආදිය තම කටයුතු ඉටුකර ගැනීම සඳහා භාවිතයට ගැනීමට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

**ක්‍රියාකාරකම**

ඔබ දන්නා භාණ්ඩ හා සේවා යොදා ගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| පාරිභෝගික භාණ්ඩ | අන්තර් භාණ්ඩ | ප්‍රාග්ධන භාණ්ඩ |
|---|---|---|
| | | |

## විවිධ අර්ථ ක්‍රම පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීම

අර්ථ ක්‍රමයක් යනු මිනිසා මුහුණ දෙන කුමක්, කොපමණ කෙසේ, කා සඳහා නිෂ්පාදනය කරනවාද යන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා විවිධ සමාජ සංවිධානය වී ඇති ආකාරයයි. මෙම අර්ථ ක්‍රම ප්‍රධාන කොටස් තුනකට බෙදේ.

1. ධනවාදී අර්ථ ක්‍රම
2. සමාජවාදී අර්ථ ක්‍රම
3. මිශ්‍ර අර්ථ ක්‍රම

### ධනවාදී අර්ථ ක්‍රමය

දේපළ අයිතිය පෞද්ගලික අංශය සතු සහ ඒවා ලාභ අපේක්ෂාවෙන් ආර්ථික කටයුතුවල මෙහෙයවන ආර්ථික සංවිධානයක් ධනවාදී අර්ථ ක්‍රමයක් ලෙස හැඳින්වේ. එවැනි ආර්ථිකයක මූලික ලක්ෂණ කිහිපයක් පහත දක්වේ.

- තරඟකාරී වෙළෙඳපොළක් පැවතීම.
- නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතු වීම.
- ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය සිදු වීම.
- ආදායම් අසමාන ලෙස බෙදී යාම.

ධනවාදී අර්ථ ක්‍රමයන්හි දී වෙළෙඳ ප්‍රචාරණය මඟින් පාරිභෝගිකයන් තම නිෂ්පාදන වෙත රඳවා ගැනීමට වෙහෙසක් ගන්නා ආකාරයක් දැකිය හැකි ය. නමුත් වෙළෙඳපොළේ ඇති නිෂ්පාදන අතරින් තම අභිමතය පරිදි භාණ්ඩ මිල දී ගැනීමේ නිදහසක් පාරිභෝගිකයාට තිබේ.

ධනවාදී අර්ථ ක්‍රම පවතින රටවල්වලට උදාහරණ ලෙස ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, ජපානය, ඕස්ට්‍රේලියාව වැනි රටවල් දැක්විය හැකි ය. කෙසේ වෙතත් ලෝකයේ පූර්ණ වශයෙන් ධනවාදී අර්ථ ක්‍රම දැකිය නොහැකි අතර යම් දේපළ රාජ්‍ය අංශය යටතේ ද පවතී.

### සමාජවාදී අර්ථ ක්‍රම

මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමෙහි ලා මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මඟින් ක්‍රියා කරන දේපළ, පොදු අයිතිය යටතේ පවතින ආර්ථික සංවිධාන ක්‍රමය සමාජවාදී අර්ථ ක්‍රමයක් ලෙස හැඳින්වේ. සමාජවාදී අර්ථ ක්‍රම සැලසුම්ගත අර්ථ ක්‍රම, රාජ්‍ය ව්‍යවසාය අර්ථ ක්‍රම ලෙස ද හඳුන්වනු ලැබේ.

එවැනි ආර්ථිකයක මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- දේපළ අයිතිය රජය සතු වීම.
- මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මඟින් ආර්ථිකය මෙහෙයවීම.
- මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී පොදු යහපත උදෙසා කටයුතු කිරීම.

සමාජවාදී අර්ථ ක්‍රම පවතින බවට ප්‍රකාශ කෙරෙන රටවලට උදාහරණ ලෙස උතුරු කොරියාව හා කියුබාව දැක්විය හැකි ය. අද වන විට පැවති සමාජවාදී අර්ථ ක්‍රම වෙනස් වෙමින් පවතින ආකාරයක් දැකිය හැකි ය.

## මිශ්‍ර අර්ථ ක්‍රමය

ධනවාදී හා සමාජවාදී අර්ථ ක්‍රම දෙකෙහි ම ලක්ෂණ ඇතුළත් අර්ථ ක්‍රම මිශ්‍ර අර්ථ ක්‍රම ලෙස හැඳින්වේ. ලෝකයේ බොහෝ රටවල දක්නට ඇත්තේ මිශ්‍ර අර්ථ ක්‍රම වේ. ශ්‍රී ලංකාව ද මිශ්‍ර අර්ථ ක්‍රමයක් සහිත රටක් ලෙස සැලකේ. මිශ්‍ර අර්ථ ක්‍රමයක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- නිෂ්පාදන සාධනවල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශය ම සතු වීම.
- මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා රජය හා පෞද්ගලික යන දෙඅංශය ම ක්‍රියා කිරීම.
- වෙළෙඳපොළ මත භාණ්ඩවල මිල තීරණය වුව ද රජය ඒ සඳහා මැදිහත් වීම.
- පෞද්ගලික හා රාජ්‍ය ව්‍යවසාය යන අංශ දෙක ම දක්නට ලැබීම.
- පොදු යහපත සඳහා සුබසාධන කටයුතු කිරීමට රජය මැදිහත් වීම.

**ක්‍රියාකාරකම්**

- ධනවාදී අර්ථ ක්‍රමවල වාසි හා අවාසි පිළිබඳ සාකච්ඡා කරන්න.
- ශ්‍රී ලංකා ආර්ථිකය තුළ දැකිය හැකි මිශ්‍ර ආර්ථික ලක්ෂණ සාකච්ඡා කරන්න.
- එමඟින් ජනතාවට ලැබී ඇති වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

# වෙළෙඳපොළ ආර්ථික සංකල්පය

වෙළෙඳපොළ ආර්ථිකය ලෙස වර්තමානයේ ක්‍රියාත්මක වන ක්‍රමය නව - ලිබරල්වාදී ආර්ථික ක්‍රමය ලෙස ද හැඳින්වේ. මේ යටතේ පෞද්ගලික අංශයට කළ හැකි දේ රජය විසින් ද නොකරන අතර, රජයේ අවම මැදිහත්වීමක් මඟින් වෙළෙඳපොළ ක්‍රියාත්මක වීමට ඉඩ ලබා දේ.

සමාජවාදී අර්ථ ක්‍රම ලෙස පැවති රුසියාව, චීනය, පෝලන්තය වැනි රටවල් ක්‍රම ක්‍රමයෙන් වෙළෙඳපොළ ආර්ථික සංකල්පය ක්‍රියාත්මක කරමින් සිටින බව වර්තමානයේ දක්නට ලැබේ.

වර්තමානයේ ක්‍රියාත්මක වන නව - ලිබරල්වාදී වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකකරණය කිරීම
- වෙළෙඳපොළ තත්ත්ව මත මිල තීරණය වීමට ඉඩ සැලසීම
- දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයන් දිරි ගැන්වීම
- සහනාධාර හා මිල පාලන ක්‍රම ලිහිල් කිරීම
- පෞද්ගලික දේපළ අයිතියට ඉඩ දීම
- ආර්ථික කටයුතුවලට රාජ්‍ය අංශයේ මැදිහත්වීම සීමා වීම
- වෙළෙඳපොළ බාධා, ආනයන අපනයන බදු ආදිය ඉවත් කිරීම
- පාලන නීති රීති, සීමා අවම කිරීම
- විනිමය අනුපාතික පාලනයකින් තොර ව නිදහසේ තීරණය වීමට ඉඩ සැලසීම

වෙළෙඳපොළ ආර්ථික සංකල්පය තුළ අහිතකර ලක්ෂණ ද හඳුනාගත හැකි ය. ඒ අතර වෙළෙඳපොළ ආර්ථිකය තුළ නිෂ්පාදන කිරීමේ දී වෙනත් පාර්ශ්වයන්ට වන බලපෑම ගැන නොසලකා හැරීමක් දක්නට ලැබේ. මෙය සෘණ බාහිරතා ලෙස හැඳින්වේ. උදා: කර්මාන්තශාලා පිහිටුවීමේ දී පරිසර දූෂණය, මහජන පීඩා ආදිය පිළිබඳ ව අවධානය යොමු නොවීම දැක්විය හැකි ය.

## වෙළෙඳපොළ ආර්ථිකයන් හි විවිධ ස්වරූප

වෙළෙඳපොළ අර්ථ ක්‍රමයන් ක්‍රියාත්මක වන රටවල් පිළිබඳ විමසා බැලීමේ දී ප්‍රධාන වශයෙන් ස්වරූප තුනක් දැකිය හැකි ය.

i. ධනවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන වෙළෙඳපොළ
උදා: ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, දකුණු කොරියාව

ii. සමාජවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබීම
උදා : උතුරු කොරියාව, කියුබාව

iii. පරිවර්තන ආර්ථික හෙවත් වෙළෙඳපොළ ආර්ථික ක්‍රම කරා ගමන් කරමින් සිටින අර්ථ ක්‍රමවල ඇති වෙළෙඳපොළ - උදහරණ වශයෙන් ආමේනියාව, අසබයිජාන්, බෙලාරස්, එස්ටෝනියාව, ජෝර්ජියාව, කසකස්තානය, ලැට්වියාව, ලිතුවේනියාව, රුසියාව, යුක්රේනය, උස්බෙකිස්තානය වැනි සෝවියට් සමූහාණ්ඩුව අයත් ව තිබූ රටවල්

පරිවර්තන ආර්ථිකයන්හි මූලික ලක්ෂණ කිහිපයක් ද හඳුනාගත හැකි ය.




**ක්‍රියාකාරකම්**

- ශ්‍රී ලංකාව තුළ ද වෙළෙඳපොළ ආර්ථිකයක මූලික ලක්ෂණ දක්නට ලැබේ ද? හේතු දක්වන්න.
- වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක් තුළ සිදුවිය හැකි වාසි හා අවාසි ලැයිස්තුගත කරන්න.

## ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම

ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයක් සහිත රටකි. අතීතයේ සිට වර්තමානය දක්වා පැවති අර්ථ ක්‍රම පරීක්ෂා කිරීමේ දී එහි විවිධ ස්වරූප දක්නට ලැබූ බව පැහැදිලි ය. රාජ්‍ය පාලනය කළ ආණ්ඩු මත එම ආර්ථික ප්‍රතිපත්ති ද වරින් වර වෙනස් වී තිබේ. 1948 අප ඉංග්‍රීසි පාලනයෙන් නිදහස ලබා ගැනීමෙන් පසු සමාජවාදී, ධනවාදී මෙන් ම මිශ්‍ර ආර්ථික ලක්ෂණ සහිත අර්ථ ක්‍රමයක් ක්‍රියාත්මක වූ බව දක්නට ලැබේ.

## ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ක්‍රමය හා සංවර්ධනය

ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ 1977 න් පසු හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මත ක්‍රියාත්මක වන වෙළෙඳපොළ හිතකර අර්ථ ක්‍රමයක් වේ. 1977 ට පෙර සමාජවාදී ලක්ෂණ දක්නට තිබුණ ද අද වන විට එය වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක් බවට පරිවර්තනය වී තිබේ.

1977න් පසු විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ පෞද්ගලික ව්‍යවසායයන් දිරිගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අර්ථ ක්‍රමයට හඳුන්වා දෙනු ලැබීය.

- පෞද්ගලික ආයෝජකයන්ට විවිධ බදු සහන ලබා දීම
- වෙළෙඳ බාධා (තීරු බදු වැනි) අඩු කිරීම
- වෙළෙඳපොළට රජයේ මැදිහත්වීම අඩු කිරීම
- විදේශ ආයෝජන දිරි ගැන්වීම
- රාජ්‍ය දේපළ පෞද්ගලීකරණය කිරීම
- විනිමය අනුපාතිකය නිදහසේ තීරණ ගැනීමට ඉඩ හැරීම
- ආනයන අපනයන ආර්ථිකයක් හඳුන්වා දීම
- රාජ්‍ය ආයතන ද තරගකාරී වෙළෙඳපොළට විවෘත කිරීම
- යටිතල පහසුකම් පුළුල් කිරීම
- නිදහස් වෙළෙඳ කලාප පිහිටුවීම

ශ්‍රී ලංකාව ද වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක ලක්ෂණ පිළිබිඹු කරන බව අපි මීට පෙර ද පැවසීමු. එවැනි ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

**ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක ලක්ෂණ**

- පෞද්ගලික අංශය දිරි ගැන්වීම
- රජය ව්‍යවසාය කටයුතුවලින් ඈත්වීම
- රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකකරණය කිරීම
- විදේශ වෙළෙඳාම සම්බන්ධ බාධා ලිහිල් කිරීම
- රජය විනිමය පාලනයෙන් ඉවත් වීම
- රජය ව්‍යවසායකයන් දිරි ගන්වන්නකු ලෙස ක්‍රියා කිරීම
- රුපියලේ විදේශ අගය වෙළෙඳපොළේ තීරණය වීමට ඉඩ හැරීම

## සංවර්ධනය හැඳින්වීම

අර්ථ ක්‍රමයක් තුළ විවිධ ආකාරයේ වර්ධන හෙවත් වැඩිවීම් දැකිය හැකි ය. ඇතැම් ඒවා සමාජයට හිතකර වුව ද ඇතැම් ඒවා අහිතකර වේ. උදාහරණ ලෙස ගත් විට අපරාධ වර්ධනය, අනතුරු වර්ධනය අහිතකර වර්ධනයන් ලෙස දැක්විය හැකි ය. ඒ අනුව සමාජයට හිතකර ආකාරයෙන් සිදුවන වර්ධන ආර්ථික විද්‍යාවේ ද සංවර්ධනය යන වචනයෙන් අදහස් වේ.

'ආර්ථික වර්ධනය' හා 'සංවර්ධනය' යනු එකක් ම නොවේ. ආර්ථික වර්ධනය යනු මූර්ත ජාතික නිෂ්පාදනයේ වසරින් වසර සිදුවන වැඩිවීමේ ප්‍රතිශතයයි. නමුත් සංවර්ධනය යනු ඊට වඩා පුළුල් වන අතර එයට ආර්ථික, දේශපාලන, සමාජීය, මානව යන සෑම අංශයක ම සමාජයට හිතකර වර්ධනයන් අදහස් වේ.

සංවර්ධනය පිළිබඳ ඉදිරිපත් ව ඇති නිර්වචන පහත දැක්වේ.

"ආර්ථික, දේශපාලන, සමාජ හා මානව යන අංශයන්ගෙන් දියුණුවීම හා දරිද්‍රතාව අවම වීමත් සමග තිරසර දියුණුව ඇති කිරීම සංවර්ධනයයි."

(එක්සත් ජාතීන්ගේ සංවර්ධන වාර්තාව, 2000)

"සංකීර්ණ සංස්කෘතික හා පාරිසරික සාධක ඒවායේ අන්තර් ක්‍රියාකාරීත්වය මත ඇතිවන ආර්ථික හා සමාජීය පරිණාමන ක්‍රියාවලිය සංවර්ධනයයි."

(www.business dictionary.com.2013.08.12)

මෑත කාලයේ වැඩිපුර සාකච්ඡාවට බඳුන් වී ඇත්තේ තිරසාර සංවර්ධනය පිළිබඳවයි. සංවර්ධනය කරා යන ගමනේ දී ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටු කර ගැනීම තිරසාර සංවර්ධනය නම් වේ. මෙය ධරණීය සංවර්ධනය ලෙස ද හැඳින්වේ.

සංවර්ධනය යන්න නිශ්චිත ව අර්ථ දැක්වීම දුෂ්කර වේ. පුද්ගල හා සමාජ පූර්ණ සංවර්ධනයක් මෙම සංකල්පයෙන් අදහස් කෙරේ. එහි දී සලකා බැලිය යුතු අංශ කිහිපයක් දැක්විය හැකි ය.



ආර්ථිකයක් සංවර්ධනය වීමේ දී ආර්ථික සංවර්ධනය පමණක් නොව තවත් විවිධ අංශ ඒ සඳහා යොමු විය යුතු බව ඉහත කරුණුවලින් පැහැදිලි වේ. එහි දී වඩා වැදගත් වන්නේ තිරසර සංවර්ධනයයි. තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු මූලික ප්‍රතිපත්ති කිහිපයක් සැච්ස් (Sachs, 2004) ද සඳහන් කර ඇත.

**තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණු**

- මූලික අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීම
- අනාගත පරම්පරාවත් සමග ඒකමතික වීම
- ජනතා සහභාගීත්වය ඇති කර ගැනීම
- ස්වාභාවික සම්පත් සංරක්ෂණය
- පරිසරය ආරක්ෂා කර ගැනීම
- සමාජ සුරක්ෂිතභාවය
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම

**ක්‍රියාකාරකම්**

- තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණු ලැයිස්තුගත කරන්න.
- තිරසාර සංවර්ධනයේ ඇති වැදගත්කම විස්තර කරන්න.

සංවර්ධනය පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ සංවිධානය 2000 දී පැවැත්වූ සහස්‍රක සමුළුවේ දී සහස්‍රක සංවර්ධන ඉලක්ක 8ක් සම්මත කර ගන්නා ලදී. ඒවා නම්,

1. දුප්පත්කම හා සාගින්න තුරන් කිරීම
2. පොදු ප්‍රාථමික අධ්‍යාපනයක් ළඟා කර ගැනීම
3. ලිංගික සමානාත්මතාව හා කාන්තාව බලවන්ත කිරීම
4. ළදරු මරණ අනුපාතිකය අඩු කිරීම
5. මානසික සෞඛ්‍ය වර්ධනය
6. ඒඩ්ස්, මැලේරියා වැනි රෝග මර්ධනය කිරීම
7. පාරිසරික තිරසර බව සුරක්ෂිත කිරීම
8. සංවර්ධනය සඳහා ගෝලීය සම්බන්ධතාවක් ඇති කිරීම

ඉහත ඉලක්ක ඉටු කර ගැනීම තුළින් සංවර්ධනය කරා ගමන් කිරීම ශ්‍රී ලංකාව ද ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබේ. අධ්‍යාපනය තුළින් ශ්‍රී ලංකාව ආසියාවේ දැනුම් කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම වර්තමානයේ ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබේ.

## වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකයේ නව සංවර්ධන ප්‍රවණතා

ශ්‍රී ලංකාව අතීතයේ දී යැපුම් කෘෂි ආර්ථිකය මත පදනම් වූ බව අපි දනිමු. නමුත් ශ්‍රී ලංකාව ඉංග්‍රීසි පාලනයට නතු වීමත් සමග ක්‍රමයෙන් වැවිලි භෝග මත පදනම් වූ ආනයන අපනයන ආර්ථිකයක් බවට පරිවර්තනය විය. 1977ට පෙර කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශවල රාජ්‍ය අංශයේ කැපී පෙනෙන දායකත්වයක් දක්නට ලැබිණි. දේශීය සම්පත් උපයෝගී කරගෙන ආනයන ආදේශන කර්මාන්ත ඇති කිරීම කෙරෙහි ද උත්සාහයන් ගනු ලැබිණ.

ශ්‍රී ලංකාවේ නව සංවර්ධන ප්‍රවණතා විමසා බැලීමේ දී නිදහසින් පසු ඇති වූ වෙනස්කම් ප්‍රධාන අවධි කිහිපයකට බෙදා දැක්විය හැකි ය. ඒ ඒ යුගයන් හි දක්නට ලැබූ විශේෂ ලක්ෂණ පහත වගුවෙන් දැක්වේ.

| අවධිය | විශේෂ ලක්ෂණ |
|---|---|
| 1948-1960 | • ආනයන අපනයන මත පදනම් වූ ආර්ථික ක්‍රමයක් පැවතීම<br>• රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙක ම ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ වීම<br>• වැවිලි කර්මාන්තයට මූලිකත්වය ලබා දීම<br>• දේශීය යැපුම් කෘෂි අංශය දිරි ගැන්වීම<br>• පෞද්ගලික ව්‍යවසායන් ජනසතු කිරීම (1956 න් පසු)<br>• පාරිභෝගික සහනාධාර ලබා දීම |
| 1961-1970 | • අර්ධ විවෘත ස්වරූපයක් ගැනීම<br>• විනිමය නීති ලිහිල් කිරීම<br>• පෞද්ගලික ව්‍යවසායකයන්ට ඉඩ ප්‍රස්තා ලබා දීම<br>• ආහාර සහනාධාර අඩු කිරීම |
| 1970-1977 | • ආවෘත නැඹුරු ආර්ථිකයක් බවට පත්වීම<br>• ආනයන ආදේශ කර්මාන්ත ඇරඹීම<br>• ආනයන සඳහා සීමා පැනවීම<br>• අත්‍යවශ්‍ය ආහාර බෙදා හැරීම සඳහා නව නීති පැනවීම<br>• සලාක ක්‍රමයක් ක්‍රියාත්මක වීම<br>• පෞද්ගලික ඉඩම් අයිතිය සීමා කිරීම<br>• දේශීය යැපුම් කෘෂි අංශය දිරි ගැන්වීම<br>• විනිමය පාලන නීති දැඩි කිරීම<br>• සංවර්ධනය වැඩි වශයෙන් දේශීය සම්පත් මත රඳා පැවතීම |

| | |
|---|---|
| 1978-1993 | • විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම<br>• ආනයන අපනයන සීමා ලිහිල් කිරීම<br>• විදේශ ආයෝජකයන්ට බදු සහන ලබා දීම<br>• අපනයන මූලික කර්මාන්ත ඇරඹීම<br>• ආහාර සහනාධාර සීමා කිරීම<br>• කාර්මික අංශයට වැඩි සැලකිල්ලක් දැක්වීම<br>• නිදහස් ආයෝජන කලාප ඇති කිරීම<br>• දුප්පත් ජනතාව සඳහා විවිධ සුබසාධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම<br>• අධ්‍යාපනය සඳහා නිල ඇඳුම්, පෙළපොත්, දිවා ආහාර නොමිලේ ලබා දීම<br>• පාඩු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලිකකරණය කිරීම |
| 1994-2004 | • විවෘත ආර්ථික ප්‍රතිපත්ති තවදුරටත් ක්‍රියාත්මක කිරීම<br>• පෞද්ගලික ව්‍යවසායන්ට බදු සහන ලබා දීම<br>• යම් රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකකරණය<br>• යටිතල පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික අංශය දායක කර ගැනීම<br>• රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම<br>• ප්‍රතිපත්ති සම්පාදනයේ දී ජාත්‍යන්තර උපදෙස් ලබා ගැනීම |

2004 වර්ෂයෙන් පසුව ද විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමක් දක්නට ලැබේ. එසේ වුව ද දේශීය කෘෂි අංශය හා ආයෝජන කෙරෙහි අවධානය යොමු වීමක් ද තිබේ. මෙම අවධියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

කොළඹ වරාය

දක්ෂිණ අධිවේගී මාර්ගය

මත්තල ගුවන් තොටුපොළ

4.11 රූපය

- රාජ්‍ය ආයතන පෞද්ගලිකකරණය කිරීම අත්හිටුවීම.
- පෞද්ගලිකකරණය කළ රාජ්‍ය ආයතන නැවත රජයට පවරා ගැනීම.
  උදා: ශ්‍රී ලන්කන් ගුවන් සේවය, සෙවණගල සීනි සමාගම, කඩදාසි කම්හල, ෂෙල් ගෑස් සමාගම (වර්තමාන ලිත්‍රෝ)
- දේශීය කෘෂි ආර්ථිකය දියුණු කිරීමට කටයුතු කිරීම. උදා: පොහොර සහනාධාරය, වී සඳහා සහතික මිලක් ලබා දීම, වී අලෙවි මණ්ඩලය පිහිටුවීම, අපි වවමු රට නගමු වැඩ සටහන.
- යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. උදා: අධිවේග මාර්ග ඉදි කිරීම, වරාය, ගුවන් තොටුපළ පිහිටුවීම, කොළඹ වරාය නවීකරණය, විදුලි බලාගාර පිහිටුවීම.

- ආර්ථික සංවර්ධනය සඳහා විවිධ ව්‍යාපෘති දියත් කිරීම. උදා : උතුරු වසන්තය, නැගෙනහිර නවෝදය, දිවි නැගුම ගමකට එක වැඩක්, මග නැගුම, ගම නැගුම, නගර අලංකරණය, මාර්ග සංවර්ධනය
- නාගරික සංවර්ධනය වේගවත් කිරීම
- දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම. උදා: සමෘද්ධි වැඩ සටහන, ස්වයං රැකියා නියුක්තිකයන් දිරි ගැන්වීම, ගෙවතු වගා වැඩ සටහන
- තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරීම. උදා: නැණසල වැඩ සටහන, විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව වෙනස්කම් සිදු කිරීම. උදා: විශ්වවිද්‍යාල සිසුනට නායකත්ව පුහුණුව ලබා දීම, තාක්ෂණ විෂයධාරා උසස් පෙළට හඳුන්වා දීම, වෘත්තීය හා තාක්ෂණ විශ්වවිද්‍යාලය පිහිටුවීම, සපිරි පාසල් දහසේ වැඩසටහන, මහින්දෝදය විද්‍යාගාර පිහිටුවීම.

දැනට සිදුවෙමින් පවතින සංවර්ධන ක්‍රියා නිසා ශ්‍රී ලංකාවට අත්වන වාසි කිහිපයක් පහත සඳහන් වේ .

| වාසි |
|---|
| • සේවා නියුක්තිය ඉහළ යාම<br>• විදේශ විනිමය ඉපයුම් ඉහළ යාම<br>• ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම<br>• ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීම<br>• ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම<br>• ලෝක අර්බුදවලට මුහුණ දීමට හැකි වීම<br>• යටිතල පහසුකම් වර්ධනය වීම<br>• නව රැකියා වෙළෙඳපොළ පුළුල් වීම<br>• ජාත්‍යන්තරය තුළ කැපී පෙනෙන තත්ත්වයක් ලබා ගැනීම<br>• සාමය පවත්වා ගැනීමට හැකි වීම |

**ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා සිදුවන විවිධ ක්‍රියාකාරකම් ලැයිස්තුගත කරන්න.
2. එම ව්‍යාපෘති තුළින් ශ්‍රී ලංකාවට ලැබෙන වාසි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

**ශ්‍රී ලංකාවේ සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවීම**

| වර්ෂය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|
| පවුල් සංඛ්‍යාව | 1960664 | 1916594 | 1844660 | 1631133 | 1600786 | 1572129 | 1541619 | 1515613 |

**ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳ දර්ශක කිහිපයක්**

| දර්ශකය | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| ළදරු මරණ අනුපාතිකය | 10.0 | 8.5 | 8.5 | 9.4 |
| උපත් අනුපාතිකය | 18.4 | 17.6 | 17.6 | 17.4 |
| සාක්ෂරතාව | 91.3 | 91.4 | 91.9 | 92.2 |
| ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත්වීමේ ප්‍රතිශතය | 102 | 91 | 97 | 92 |
| මානව සංවර්ධන දර්ශකයට අනුව ශ්‍රී ලංකාවට හිමි තැන | 102 | 91 | 97 | 92 |

**ක්‍රියාකාරකම්**

- ඉහත දර්ශකයන්ට අමතර ව ශ්‍රී ලංකාවට වැදගත්වන වෙනත් දර්ශක ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා ඇසුරින් සකස් කරන්න.
- මෙම දර්ශක අනුව ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳ ව කෙටි වාර්තාවක් පිළියෙල කරන්න.

## තාක්ෂණික දියුණුව හා ගෝලීයකරණය ලෝක ආර්ථිකය හා ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම

### තාක්ෂණික දියුණුව හා ගෝලීයකරණය

හුදෙකලාව ජීවත් වූ මිනිසා සමූහයක් ලෙස ජීවත්වීමට පටන් ගැනීමත් සමග විවිධ සොයා ගැනීම් සඳහා ද යොමු විය. යුරෝපයේ ඇතිවූ නව කාර්මික පුනරුදයත් සමග නව තාක්ෂණය ද ක්‍රමයෙන් දියුණු විය. අද වන විට මෙම විද්‍යාත්මක හා තාක්ෂණය පදනම් කර ගෙන ලෝකයේ සෑම අංශයක් ම එකට සම්බන්ධ වී තිබේ. එය විශ්ව ගම්මානය හෙවත් ගෝලීයකරණය ලෙසින් ද හඳුන්වනු ලැබේ.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

4.12 රූපය - නවීන සන්නිවේදන උපකරණ කිහිපයක්.

නවීන තාක්ෂණයත් සමග නිර්මාණය වී ඇති නිෂ්පාදන කිහිපයක් ඉහත රූපසටහනින් දැක්වේ. මෙම තාක්ෂණ උපකරණ කර්මාන්ත, සන්නිවේදනය, වෙළෙඳාම, අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහන වැනි සෑම අංශයක් කරාම විහිදී ඇති බව ද කිව හැකි ය.

ලෝකයේ ඇතිවන සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමගම මුළු ලෝකයේ ම රටවල් එකිනෙකට සමීප වී තිබේ. ලොව කොතනක වුව ද සිදුවන සිදුවීමක් අපට ක්ෂණයකින් ම දැනගත හැකි වන්නේ එබැවිනි. තාක්ෂණයත් සමග ලෝකය සමීප වීම ගෝලීයකරණය ලෙසින් ව්‍යවහාර කරනු ලැබේ.

ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ක්‍රියාකාරීත්වයන් තුළ සිදුවන අන්‍යෝන්‍ය සම්බන්ධතාව ගෝලීයකරණය නම්වේ. ලෝක ආර්ථිකය එක ඒකකයක් බවට පත්වීම ද ගෝලීයකරණය ලෙස දැක්විය හැකි ය. ලෝක ආර්ථිකයේ එක් රටක සිදුවන ආර්ථික වෙනස්කම් නිසා අනෙකුත් රටවලට බලපෑම් එල්ලවනුයේ එබැවිනි.

ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- වැඩ ලෝකය පුළුල් වීම
- ගෝලීය වෙළෙඳපොළ පුළුල් වීම
- ලෝකයේ ඕනෑම රටක ජීවත්වීමට හැකිවීම
- තම දක්ෂතා හා හැකියා අනුව වෙනත් රටක සේවය කිරීමට හැකිවීම
- අඩු මිලට ශ්‍රමය ලබා ගත හැකි රටවලට කර්මාන්ත සංක්‍රමණය වීම

ගෝලීයකරණය ව්‍යාප්තවීමට ආර්ථික හේතු මෙන් ම දේශපාලන, සමාජීය හා සංස්කෘතික හේතු ද බලපායි. මෙම සංකල්පය දියුණු රටවල් වෙනත් රටවලට දේශපාලන බලපෑම් කිරීමට යොදා ගනී. උදා: වෙළෙඳපොළ පාලනය, සම්බාධක පැනවීම ආදිය. විවිධ සංස්කෘතික සම්මිශ්‍රණයක් සිදුවීම ද ගෝලීයකරණය නිසා සිදුවේ. එසේ ම ලෝක බලවතුන් ලෝක වෙළෙඳපොළ තුළ තම ආධිපත්‍යය පවත්වා ගැනීමට කටයුතු කිරීමට ද ගෝලීයකරණය යොදගෙන තිබේ. සංවර්ධනය වන රටවල් සඳහා නව යටත් විජිතවාදය පැතිරවීම වැනි ලක්ෂණ ද ගෝලීයකරණය නිසා සිදුවිය හැකි ය.

**ක්‍රියාකාරකම**

- ගෝලීයකරණය පිළිබඳ ව තොරතුරු රැස් කරන්න.

## ගෝලීයකරණය ලෝක ආර්ථිකයට කරන බලපෑම්

ගෝලීයකරණය තුළ ජාත්‍යන්තර වෙළෙඳාම විවිධ වෙනස්වීම්වලට ලක්ව තිබේ. ලෝකය ම එක ම භාෂාවක් කථා කරන එක ම මුදල් ඒකකයක් භාවිත කරන තනි ජාතියක් බවට පත් විය යුතු බව යුරෝපා සංගමයේ අදහසයි. යුරෝපා සංගමය තම කලාපය තුළ යූරෝ නමින් පොදු මුදල් ඒකකයක් පවත්වා ගැනීමට කටයුතු කර තිබීම මීට නිදසුනකි.

ගෝලීයකරණය තුළ ලොව ම තනි ආර්ථික ඒකකයක් බවට පත් කිරීම ලෝක බලවතුන්ගේ උත්සාහය බව මීට ඉහත දී සඳහන් කළෙමු. එයට සහාය වීම සඳහා ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ආසියානු සංවර්ධන බැංකුව ලෝක වෙළෙඳ සංවිධානය වැනි විවිධ ආයතන පිහිටුවා ගෙන තිබේ. එම ආයතන තුළින් අනෙකුත් රටවලට ඍජුව හා වක්‍රව බලපෑම් කරන ආකාරයක් ද දැකිය හැකි ය.

ගෝලීයකරණය නිසා ලෝක ආර්ථික තුළ දක්නට ඇති ලක්ෂණ



මෙවැනි බලපෑම් තුළින් ලෝක බලවතුන් තම ලාභ උපරිම කර ගැනීම මෙන් ම දේශපාලන ස්ථාවරත්වය ඇති කර ගැනීම ද අපේක්ෂා කරනු ලැබේ.

ගෝලීයකරණයට මුහුණ දීමට විවිධ රටවල් එකතු වී විවිධ සංවිධාන බිහි කර ගැනීමේ ප්‍රවණතාවක් වර්තමානයේ දක්නට ලැබේ. එවැනි සංවිධාන කිහිපයක් හා ඒවායේ අරමුණු පහත වගුවෙන් දැක්වේ.

| සංවිධානය | සාමාජික රටවල් | අරමුණු |
|---|---|---|
| යුරෝපා සංගමය (EU) | ඔස්ට්‍රියාව, ප්‍රංශය, ඩෙන්මාර්කය, බෙල්ජියම, ජර්මනිය, පින්ලන්තය, ග්‍රීසිය, අයර්ලන්තය, ඉතාලිය, නෙදර්ලන්තය, ලක්සම්බර්ග්, පෘතුගාලය, ස්පාඤ්ඤය, ස්වීඩනය, මහා බ්‍රිතාන්‍යය | මූල්‍ය ගනුදෙනු වඩා ක්‍රමවත් කිරීම<br>නිර්බාධ වෙළෙඳාම ව්‍යාප්ත කිරීම |
| උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA) | ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, මෙක්සිකෝව | නිදහස් වෙළෙඳාම |
| දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුම (SAPTA) | ශ්‍රී ලංකාව, ඉන්දියාව, පකිස්ථානය, බංගලිදේශය, භූතානය, නේපාලය, මාලදිවයින | කලාපීය වෙළෙඳාම පුළුල් කිරීම |
| බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවා ගත් ආර්ථික සහයෝගීතා සංගමය (BIMST-EC) | බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය, තායිලන්තය, ශ්‍රී ලංකාව | රෙදිපිළි, ඇඟලුම්, ඖෂධ හා තොරතුරු තාක්ෂණය ආදී ක්ෂේත්‍රවල ආයෝජන පුළුල් කිරීම<br>රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දිරි ගැන්වීම<br>තාක්ෂණික හුවමාරුව<br>කලාපීය සහයෝගිතාව ඇති කිරීම |

මීට අමතර ව ලෝක ආර්ථික කණ්ඩායම් බිහිවීම ද ගෝලීයකරණය නිසා සිදුව ඇත. උදා: G7, G77, G24, G15 වැනි සංවිධාන බිහිවීම. ලෝක ආර්ථික ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා සාමූහික ව කටයුතු කිරීම, දියුණු රටවලින් එල්ලවන ආර්ථික බලපෑම්වලට සාමූහික ව මුහුණ දීම මෙම ජාත්‍යන්තර ආර්ථික කණ්ඩායම් පිහිටුවා ගැනීමේ මූලික අරමුණ වී තිබේ.

**ක්‍රියාකාරකම**

- ඔබ දන්නා තවත් එවැනි ලෝක සංවිධාන හෝ ගිවිසුම් පිළිබඳ තොරතුරු රැස් කර පොත් පිංචක් පිළියෙල කරන්න.

## ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන බලපෑම්

ගෝලීයකරණයෙන් මිදීමට ශ්‍රී ලංකාවට ද නොහැකි වී තිබේ. ගෝලීයකරණය නිසා සිදුවන බලපෑම් අපට ද භුක්ති විඳීමට සිදු වේ. 1977න් පසු ක්‍රියාත්මක වන විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා ගෝලීයකරණයේ බලපෑම් වැඩි වැඩියෙන් දැනෙන්නට පටන් ගෙන තිබේ. නිෂ්පාදනය හා වෙළෙඳාම ලෝක වෙළෙඳපොළට විවෘත වීම එයට හේතුවයි.

ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇතිවී තිබෙන ධනාත්මක හා ඍණාත්මක බලපෑම් කිහිපයක් පහත දැක්වේ.

### ධනාත්මක බලපෑම්

1. විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම
2. වැඩලෝකය තුළ නව රැකියා අවස්ථා නිර්මාණය වීම නිසා සේවා වියුක්තිය අඩු වීම
3. දේශීය නිෂ්පාදන සාධකවලට වැඩි ඉල්ලුමක් ඇතිවීම
4. කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇතිවීම
5. ජාත්‍යන්තර වෙළඳපොළ පදනම් කරගත් දේශීය නිෂ්පාදන බිහි වීම
6. ගෙවුම් ශේෂ තත්ත්වය යහපත් වීම
7. ආර්ථිකය විවිධාංගීකරණය වීම
8. ගුණාත්මක බවින් ඉහළ නිෂ්පාදන බිහිවීම (නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා භාණ්ඩවල ගුණාත්මකභාවය ඉහළ යාම)
9. විදේශීය විශේෂඥ දැනුම මෙරටට ගලා ඒම නිසා දේශීය මානව සම්පත දියුණු වීම
10. නිෂ්පාදන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් වීම
11. දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකිවීම
12. මහා පරිමාණ කර්මාන්ත නගරයෙන් බැහැර ව ස්ථානගත වීම නිසා ප්‍රාදේශීය සංවර්ධනයක් සිදුවීම
13. විවිධ කලාපීය සංවිධාන හා එකතුවීමට හැකිවීම
14. අකාර්යක්ෂම කර්මාන්ත වෙළෙඳපොළෙන් ඉවත් වීම
15. දේශීය පාරිභෝගිකයාට ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු භාණ්ඩ ලබා ගැනීමට ඉඩ සැලසීම

## සෘණාත්මක බලපෑම්

1. බහුජාතික නිෂ්පාදන සමඟ දේශීය නිෂ්පාදනයන්ට තරඟ කිරීමට නොහැකි වීම
2. කාර්මික ආයතනවලින් සිදුවන පාරිසරික හානි ඉහළ යාම
3. විදේශ විනිමය ලාභාංශ, පොලී හා ණය වාරික ලෙසින් විදේශවලට ඇදී යාම
4. බුද්ධි ගලනය වේගවත් වීම
5. සංවර්ධිත රටවලින් සිදුවන බලපෑම් ඉහළ යාම
6. දේශීය සංස්කෘතියට විවිධ බලපෑම් එල්ල වීම
7. නොගැළපෙන ආර්ථික හා පාරිභෝජන රටා රට තුළ ප්‍රචලිත වීම
8. විදේශ ණය හා ආධාර මත යැපීමට සිදුවීම
9. ලෝක ආර්ථිකයේ වෙනස්කම්වලට සෘජුව ම මුහුණ දීම
10. රාජ්‍ය අංශය ආර්ථික කටයුතුවලින් ඈත්වීම නිසා මහජන සුබසාධනය සම්බන්ධ ගැටලු මතුවීම
11. විදේශ ණය ලබා ගැනීමේ දී කොන්දේසිවලට යටත්වීමට සිදුවීම
12. මිල පාලනය වැනි ආරක්ෂණවාදී උපක්‍රමවලින් ඈත්වීම නිසා දිළිඳු ජනතාව පීඩාවට පත්වීම
13. දේශීය සම්පත් සූරා කෑමට ලක්වීම
14. දේශීය යැපුම් ආර්ථික රටාව විනාශ වීම
15. දේශීය ළදරු කර්මාන්ත විනාශ වී යාම

ගෝලීයකරණය වේගයෙන් ව්‍යාප්ත වීම නිසා එහි වාසිවලට මෙන් ම අවාසිවලට ද මුහුණ දීමට සිදුවන බව පැහැදිලි ය. ජනතාව දැනුවත් කිරීම තුළින් අවාසිදායක බලපෑම් අවම කර ගැනීමට හැකිවනු ඇත.

### ක්‍රියාකාරකම්

1. ගෝලීයකරණය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සිදුව ඇතැයි සැලකෙන වෙනස්වීම් මොනවා ද?
2. ගෝලීයකරණයෙන් සිදුවන සෘණාත්මක බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාව අනුගමනය කරන ක්‍රමවේද මොනවාද?
3. ඒ සඳහා ගත හැකි වෙනත් ක්‍රියාමාර්ග යෝජනා කරන්න.
4. ''බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා ගෝලීයකරණයේ බලපෑම'' ඉහත මාතෘකාව සඳහා බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.